
## 3.21 සංඛ්‍යා රටා (ත්‍රිකෝණ සංඛ්‍යා/ සමචතුරස්‍ර සංඛ්‍යා) නිරූපණය සඳහා උපකරණයක් නිමවුම හා භාවිතය

(අ) පෙර දැනුම

i. සංඛ්‍යා රටා පිළිබඳ අවබෝධය
ii. ගණක භාවිතයෙන් සංඛ්‍යා රටා ගොඩ නැගීම
iii. ගණක සැකැස්මේ හැඩය අනුව නාමකරණය කරණ බව.

(ආ) උපකරණය සහ එහි උපාංග




(ඇ) උපකරණ නිමවුමට කාර්යය පත්‍රිකාව

i. (a) හි පරිදි කපාගත් කුඩා වර්ණවත් වෘත්ත 100ක් පමණ සමාන පේළි 10කට හා සමාන තීර 10කට සම පරතරයෙන් $A_4$ කඩදාසියක අමුණා ගන්න.

ii. (b) හි පෙනෙන පරිදි උපාංග ii හැඩය කපා ගන්න.දෙපස සකසා ගත් කාණු දෙකක් දිගේ උත්තරණය කළ හැකි පියන් පතක් ලෙස උපාංග (b)

iii. කොටස, ප්‍රධාන කොටස වන උපාංග a මත එකලස් කර ගන්න.

(ඇ) උපකරණ භාවිතයට කාර්යය පත්‍රිකාව

i. (b) උපාංගය, 10x10 සමචතුරස්‍රකාර තලය මත සමචතුරස්‍රයේ විකර්නය ඔස්සේ උත්තරණය කළ විට සමචතුරස්‍ර සංඛ්‍යා සෘජු කෝණී මුල්ලෙන් නිරූපනය වේ.

ii. (b) උපාංගය උත්තරණය කරන විට (b) උපාංගයේ පහළ සරල රේඛාවෙන් ත්‍රිකෝණ සංඛ්‍යා වෙන්කර දක්වයි.

iii. ඉහත (I) හා (II) මගින් ලබා ගන්නා සංඛ්‍යා රටා සඳහා පොදු පදය (Tn) ප්‍රකාශ කරන්න.

(ඉ) අමතර.

i. වෙනත් විශේෂිත සංඛ්‍යා රටා (ගුණාකාර/ප්‍රථමක/සංයුත) සඳහා ඔබ විසින් නව නිර්මාණයක් කර අදාළ කාර්ය පත්‍රිකා ද සමග ඉදිරිපත් කරන්න.